# පාඬිග්ගම ගම්මානය ආශ්‍රිත ඇදහිලි විශ්වාස පිළිබඳ මානවවංශ පුරාවිද්‍යා අධ්‍යයනයක්

කේ.එම්.එල්.ඩී ධර්මරත්න[1], ආර්.ඩී.ඩී පුෂ්ප කුමාර[2], පී.ඩී.එම් පතිරණ[3]

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් " පාඬිග්ගම" වන්නි වැදි ජනතාව නියෝජනය කරන ගම්මානයකි. පාඬිග්ගම ජන සංස්කෘතිය තුළ සංස්කෘතික ලක්ෂණ බොහෝමයක් අන්තර්ගත ව ඇත. ඒ අතර ඇදහිලි විශ්වාස සුවිශේෂී ස්ථානයක් ගනී. මානවවංශ විද්‍යාත්මක න්‍යායන් භාවිතයෙන් පාඬිග්ගම ආශ්‍රිත ඇදහිලි විශ්වාස අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. ප්‍රාදේශීය කලාප වශයෙන් පාඬිග්ගම ජනයා සතු ඇදහිලි විශ්වාස සුවිශේෂ වන්නේ කෙසේ ද යන්න පර්යේෂණ ගැටලුව වේ. අධ්‍යයන කටයුතු ආරම්භයේ දී සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයට මූලික අවධානය යොමු විය. වන්නි වැදි ජනතාව පිළිබඳ පූර්ව පර්යේෂණ කිහිපයක් සිදු වී ඇති නමුත් පාඬිග්ගම ඇදහිලි විශ්වාස පිළිබඳ පර්යේෂණ සිදු වී නැති බව පූර්ව පර්යේෂණ අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. පර්යේෂණ ක්‍රමවේදයේ දී ගම්මානයේ ඇති ඇදහිලි විශ්වාස සම්බන්ධ පුරාවිද්‍යාත්මක සාධක ද අධ්‍යයනය කිරීම සිදු විය. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පාඬිග්ගම ගම්මානයේ වැඩිහිටි පිරිස් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ශාන්තිකර්ම සිදුවන ආකාරය නිරීක්ෂණය, ඡායාරූපකරණය, සටහන්කරණය, ජනශ්‍රැති අධ්‍යයනය  පර්යේෂණ ක්‍රමවේද අතර ප්‍රධාන විය. එමෙන්ම මානවවංශ පුරාවිද්‍යාවේ එන සමාන්තර උදාහරණ තර්කන ක්‍රියාවලිය වැනි න්‍යායන් ඔස්සේ පාඬිග්ගම ඇදහිලි විශ්වාස සුවිශේෂී වන්නේ කෙසේ ද යන්න නිරීක්ෂණය කිරීම ද අධ්‍යයන ක්‍රමවේදයට අයත් විය. පාඬිග්ගම ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් ඇදහිලි විශ්වාස කිහිපයක් දැකිය හැකි වේ. වැවේ කිරි ඉතිරවීම, දෙවියන් මායම් වීම, පිදේනි ශාන්තිය ආදිය ඒ අතර ප්‍රධාන වේ. දෙවියන් මායම් වීමේ දී යොදා ගන්නා දේව ආභරණ කට්ටලය ද්‍රව්‍යාත්මක සාධක අතර විශේෂත්වයක් ගනී. එම ශාන්තිකර්ම සඳහා උඩැක්කිය සහ අත් සළඹ යොදා ගැනීම ද දැකිය හැකිය. මෙම ද්‍රව්‍යාත්මක සාධක සහ ජනශ්‍රැති අධ්‍යයන ඔස්සේ පාඬිග්ගම ඇදහිලි විශ්වාස සුවිශේෂී වන ආකාරය දැකිය හැකිය. පාඬිග්ගම ගම්මානය කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති වන්නි වැදි ජනතාව වාසය කරන එකම ගම්මානය වීම සහ කුල ක්‍රමය හේතුවෙන් මෙහි ඇති ඇදහිලි හා විශ්වාස ඔවුන්ටම ආවේණික ස්වරූපයක් ගනි. එබැවින් වියැකී යන පාඬිග්ගම ඇදහිලි විශ්වාස ආරක්ෂා කරගැනීම ඉතා ඉක්මනින් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

**ප්‍රමුඛ පද :** පාඬිග්ගම, වන්නි වැදි ජනතාව, ඇදහිලි විශ්වාස, ජනශ්‍රැතිය, මානවවංශ පුරාවිද්‍යාව

---

[1 2] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. lakshithadeshan84@gmail.com
[3] ලලිතකලා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,.dilanjana.mp@gmail.com